
# ඔබට සිතන්නට යමක්!
# Something to ponder !



✾ Every one knows about Alexander Graham Bell (Scottish) who invented the telephone, but he never made a call to his family, because his wife and daughter were deaf.

That's life - " live for others "

ටෙලිපෝනය නිපදවූ ස්කොට්ලන්ත ජාතික ඇලැක්සැන්ඩර් ග්‍රෙහැම් බෙල් ගැන බොහෝ දෙනා දැන සිටිති. බොහෝ දෙනා නොදන්නා කාරණයක් ද ඇත. එනම්, ඔහු කිසි දිනක තම පවුලේ අයට ටෙලිපෝන් කළේ නැති බවය. ඒ ඔහුගේ බිරිඳ සහ දියණිය යන දෙදෙනාම බිහිරි අය වූ බැවිනි. ජීවිතය එවැනිය. ශ්‍රේෂ්ඨ මිනිසුන් බොහෝ විට තම ජීවිතය කැප කළේ තමන්ට වඩා අනුන් වෙනුවෙනි.

✾ The worst in life is **"attachment."** It hurts when you lose it. The best thing in life is " **loneliness** ", because it teaches you everything and when you lose it you get everything.

ජීවිතයේ වඩාත්ම දුක හා අසංතෝෂය ගෙන දෙන නරකම දෙය වන්නේ බන්ධනය හෙවත් බැඳීමයි. ජීවිතයේ හොඳම දේ නොබැඳීමයි. තනිකමයි. එම තනිකම ඔබට සෑම දෙයක්ම උගන්වයි. එය නැතිවී ගිය දිනක ඔබට හැම දේම ලැබේ.


✾ Life is not about the people who act true to your face... It's about the people who remain true behind your back.

සැබැවින්ම අපේ ජීවිතයට අවශ්‍ය වන්නේ අපේ මුහුණට අවංකව හැසිරෙන අය නොව, අප ළඟක නැති විටත් අප වෙනුවෙන් කතාකරන සහ අවංකවම පෙනී සිටින අයය.



✾ Egg broken from outside force...a life ends. If an egg breaks from within...life begins. Great things always began from within.

බිත්තරයක් පිටතින් පොඩිකර බින්ද කල එහි ඇති ජීවයද නැසී යයි. එහෙත් බිත්තරයක් ඇතුළතින් බිඳුණු විට ඉන් ජීවිතයක් පටන් ගනී. මතක තබාගන්න ශ්‍රේෂ්ඨ දේ බිහි වන්නේ පිටතින් නොව ඇතුළතිනි.



✾ It's better to lose your ego to the one you love than to lose the one you love ...because of ego.

ආඩම්බරකම රකින්නට ගොස් තමා ආදරය කරන කෙනා නැතිකර ගන්නවාට වඩා, ඒ ආදරය හමුවේ ආඩම්බරකම නැතිකර ගැන්මට වුවහොත් එය වඩා හොඳ ය.



✾ A relationship doesn't shine by just shaking hands in good times. But it blossoms by holding firmly in critical situations

හැම දේම යහපත්ව සිදුවන කල්හි මිනිසුන් හිනාවෙමින් එකිනෙකාට අතට අත දුන් පමණින් හිතවත්කම් හා සබඳතා නොපවතී. ඒවා දළුලා වැඩෙන්නේ ඔවුන් දුෂ්කර

# මුළු හදින් පෙම්කළ රසිකයින් අතහැර නික්මයයි නාරද...!



නාරද දිසාසේකර මහතා

**ගා**යන ශිල්පී හා සංගීතඥ නාරද දිසාසේකරයන් වියෝ වූ පුවත ඇසූ මම ඉතා කම්පාවට පත්වීමි. ඒ බොහෝ කාරණා හේතුවෙනි. ඔහු ගයා ඇති ගී සියල්ලටම පාහේ මම ඇළුම් කරමි. ඔහු උගත් පාසැලේ මම ද සිප්සතර හැදෑරුවෙමි. මම ඔහුගේ සරල ගී වැඩසට හන් සඳහා ගීත ලියා ඇත්තෙමි. ඒ හැමට වඩා මම ඔහු කලක් ඉතා සමීපව ඇසුරු කළෙමි.

හැටේ දශකයේ ශ්‍රීලංකාවේ යොවුන් පරපුර අතරේ අතිශය ජනප්‍රිය වූ විරහ ගීතයක් වෙයි. දැන් මෙන් රූපවාහිනී නොතිබුණු ඒ යුගයේ දුකට සැපට සියල්ලටම තිබුණේ ගුවන්විදුලිය පමණකි. එහෙත් එය මුළු මහත් ලංකාවේම ශ්‍රාවක ජනතාව එක් දැහැනක බැඳ තබන්නට සමත්විය. අද නාලිකා සිය ගණනකින් ඇහෙන ඝෝෂාකාරී, හර සුන්, බොළඳ, ග්‍රාම්‍ය, විකාර, කුරෝළු වාග්ලාප ගැයුම් නොව ඒ යුගයේ, විශේෂයෙන්, ස්වදේශීය අංශයෙන් සිංහළ ශ්‍රාවක මනස පුබුදුවන චාම් සරල ගීත ප්‍රචාරය විය. ඒ එදා ගුවන් විදුලියෙන් ඇසූ ජනප්‍රිය විරහගීතය වන "මුළු හදින් මම ඇයට පෙම්කොට " ගායනයෙන් නාරද දිසාසේකර නමැති ගායකයා නොමියෙන, නොමැකෙන සටහනක් අපේ සිත්තුළ තැබුවේය. එදා වාගේම අදත් ඒ ගීතයට මම ඉතා ඇළුම් කරමි. (එහි පද රචනය - එඩ්මන්ඩ් ජයසූරියගේය. තනුව හා සංගීතය කුලරත්න තෙන්නකෝන්ගේය)

කළුතර විද්‍යාලය සිප්සතර බෙදා දුන්නා පමණක් නොව එය නාරදගේ ජීවිතය කලාත්මක අංශයට යොමු කරන්නට බෙහෙවින් බලපෑ සාධකයක් ද වූයේය. කඩවසම් තරුණයෙකු වූ නාරද පාසැල් සමයේ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු වීය. ඔහු වසර ගණනක් එහි ක්‍රිකට් කණ්ඩායමේ නායකයා මෙන්ම, වේග පන්දු යවන්නා ද වූයේය. ඔහුගේ ක්‍රිකට් කෞශල්‍යය දැක්වෙන පින්තූර තවමත් කළුතර විද්‍යාලීය ශාලාවේ දැකිය හැකි ය.

කළුතර විද්‍යාලයේ සංගීත ආචාර්ය සීමන් ලොකුලියන මහතා යටතේ සංගීතය හැදෑරූ නාරද වයලීන වාදනයට ද හුරුවූයේය. ලොකුලියන මහතා ළඟින් ඇසුරු කළ අය අතර සුනිල් ශාන්ත සහ ආනන්ද සමරකෝන් දෙදෙනාද වූහ. මේ සියල්ලේ හොඳ ප්‍රතිඵලය වූයේ ලොකුලියන මහතා දේශීය සංගීතයේ හා දේශීය රටාවේ ගායනාවනිහි අගය තම ශිෂ්‍යයින්ට පුන පුනා කියාදීමයි. පණහේ හටේ දශක යන්හි දැඩිලෙස හින්දිගීත කොපිකිරීම සහ ඒ අනුකාරක ගායකයින් අතොරක් නැතිව බිහිවෙද්දී නාරද දිසාසේකර ඒ දෙසට නොගොස් සම්භාව්‍ය සිංහළ ගී ආරට නැඹුරුවන්ට මූලික හේතුව වූයේ එයයි. අවසාන මොහොත දක්වාම ඔහු සැබෑ දේශීය කලාකරුවෙකු වීය.

1954 වසරේ නාරද ගුවන් විදුලියට බැඳුණේ ශබ්ද පරිපාලකයෙකු ලෙසිනි. 1955 සරල ගී ගායකයෙකු ලෙස සමත්වූ ඔහුගේ මුල්ම ගීතය වූයේ **තිලෝ තිලක සුගත පියා** නම් ගීතයයි. ඊට සුළු කලකට පසු ඔහු මල්ලිකා කහවිට සමග ගැයූ **චන්දන ඇඟ ගාලා, කොණ්ඩෙ කඩා දාලා** (පද- කරුණාරත්න අබේසේකර, සංගීතය - කුලරත්න තෙන්නකෝන්) නාරද ගේ වඩාත් ජනප්‍රිය වූ ගීතයයි.

ගුවන්විදුලියේදී විවිධ කලාකරුවන්, බහුශ්‍රැතයන්, විද්වතුන් රාශියකගේ ඇසුර ලැබීම නාරදගේ කලා ජීවිතය ඔපමට්ටම් වන්නටද, කුසලතාපූර්ණ ගායකයෙකු ලෙස සංගීතවේදීන්ගේ බුහුමන් ලබන්නටද හේතුවිය.

1962 දී බිහිවුණු වර්ණයෙන් තැනූ ප්‍රථම සිංහල චිත්‍රපටය වන රන්මුතු දූව බොහෝ ආකාරයෙන් අපේ සිනමාව, රඟපෑම, සංගීතය සහ චිත්‍රපට කරණයද නොසිතූ විපර්යාස යකට භාජනය කරමින් ඒ තුළින් අපූර්ව කලා කරුවන් රැසක් බිහි කළ චිත්‍රපටයද වූයේය.

මයික් විල්සන්, තිස්ස ලියනසූරිය, ශේෂා පළිහක්කාර වැනි අධ්‍යක්ෂකවරු, නිශ්පාදක වරු සිංහළ සිනමාව ජාත්‍යන්තර මට්ටමට ඔසවාතැබීමේ මුල්පියවර තැබුවේ රන්මුතු දූවෙනි. ගාමිණී ෆොන්සේකා නම් රංගන ශිල්පියා සාමාන්‍ය නොව විශේෂිත නළුවෙකු ලෙස අප රට හඳුනාගත්තේ රන්මුතු දූවෙනි. ගායකයෙකු ලෙස පමණක් අප දැන සිටි විශාරද අමරදේවයන් චිත්‍රපට සංගීත අධ්‍යක්ෂකවරයෙකු හා ගීතනු රචකයෙකු ලෙස වඩාත් ජනප්‍රිය තලයකට ඔසවා තැබූයේද රන්මුතු දූවයි. ඒ රන්මුතු දූවට පසුබිම් ගායකයෙකු ලෙස නාරද එක්වුණේ සංගීත අධ්‍යක්ෂණය බාරගත් අමරදේවයන්ගේ ආරාධනයක් පරිදිය. එහි ඔහු නන්දා මාලිනී සමග ගැයූ ගලන ගඟකි ජීවිතේ, පිපී පිපී රේණු නටන, පාරමිතා බල පූරිත පූජිත ආදී ගී චිත්‍රපටය තිරගතවීමත් සමග ලංකාව පුරා එක රැයින් ජනප්‍රිය වීය.

එසේම 1964 ප්‍රථම සරසවි සම්මාන උළෙලේදී නාරද දිසාසේකර හොඳම චිත්‍රපට පසුබිම් ගායනයට හිමි සරසවි සම්මානයද දිනාගත්තේය. එතැන් පටන් ඔහුගේ ගායනා ජනතාවගේ අප්‍රමාණ අගැයීමට ලක්විය.

විශාරද අමරදේවයන් ඇතුළු බොහෝ ප්‍රවීන සංගීතඥයින් පවසන පරිදි නාරදගේ සුවිශේෂ, ප්‍රබල කටහඬ පසුබිම් ගායනයේදී චිත්‍රපටයට විශේෂත්වයක් එක්කරන්නේය.

ගමන නොනිමෙයි (සිකුරු තරුව), පුෂ්ප මකරන්දය මාගේ - සුජාතා සමග (සිහින හතක්) ආදර නිල් දෑසේ (මනමාලයෝ), අයියලා සහ අක්කලා (රෑණ ගිරව්), ලස්සන සැමදේ(හතර කේනදරේ) යන චිත්‍රපට ගීත මගින් පසුබිම් ගායකයෙකු ලෙස ඔහු ඔහුටම අනන්‍ය වූ සටහනක් තැබුවේය. එසේම නාරද එල්. එම්. පෙරේරාගේ හතර කේන්ද්‍රය චිත්‍රපටයෙන් සිනමා සංගීත අධ්‍යක්ෂකවරයෙකු ලෙස ඉදිරියට ආවේය.

මෙතෙක් මා ලියූවේ නාරදගේ කලා ජීවිතය ගැන බොහෝ දෙනා දන්නා දේය. නාරද සමීපව දැන සිටි බොහෝ දෙනා දුක්වන්නේ ඔහු හොඳ යහපත් මිනිසෙකු බැවිනි. මේ එංගලන්තයේද නාරදගේ වියෝවෙන් ශෝකවන අය බොහෝ සිටිති. වකුල ගුණපාල ඉන් කෙනෙකි. විල්ප්‍රඩ් පෙරේරා තවත් කෙනෙකි. විල්ප්‍රඩ් ද ඔහුගේ බිරිඳ නීතාද ලංකා ගුවන් විදුලියේ එකල නාරද සමග එකට වැඩ කළ අයයි. මේ කාටත් නාරද බොහෝ කලකින් හමුවී නැති නමුත් නාරද පිළිබඳ අතීත දැන හැඳිනුම්කම තවම ඔවුන් තුළ ඒ අයුරින්ම සටහන්ව ඇත.

වසර පහකට පෙර මා ගෙදර ගිය අවස්ථාවේ මම නාරද හමුවීමි. අපි අවන් හලකට ගොස් සප්පායම් වෙමින් ආගිය තොරතුරු කතා කළෙමු. එදා ඔහු මට කීවේ "දයා ඔහාට වෙලා හැමදාම ඉන්න එපා.... මෙහේ ඇවිත් ඉන්න.... එතකොට අපිට දකින්නවත් පුලුවන් නේ..." යනුවෙනි. ඔහු කී දේ සැබෑවකි.

නාරද දිසාසේකර හිතවතාණන්ට නිවන්සුව අත්වේවායි! පතමි.

♦ *දයා ආනන්ද රණසිංහ*

✾ Heated gold becomes ornaments. Beaten copper becomes wires. Depleted stone becomes statue. So more pain, more gain (valuable).

රත්‍රං රත්කිරීමෙන් පියකරු ආභරණ සාදති. තඹ ලෝහය තලා සිහින් කම්බි තනති. විශාල ගල්, මිටි වලින් ගසා තලා පිළිම බවට හරවති. එසේම දුක්, වේදනා හා කරදර ජීවිතයට පරිණත බව හා අලංකාරය ගෙන එති.

✾ When you trust someone trust him completely without any doubt. At the end you would get one of the two: Either a lesson for your life, or a very good person.

ඔබ කිසිවෙකු කෙරෙහි විශ්වාසය තබන විට බාගෙට නොව, 100% ක්ම විශ්වාසය තබන්න. අවසානයේ දෙකෙන් එකක් සිදුවේ. එක්කෝ ජීවිතයට හොඳ පාඩමක් ඔබ ඉගෙන ගනී. එසේ නැත්නම් හොඳම පුද්ගලයෙකු හඳුනාගන්නට ලැබුණේ යයි ඔබ සතුටට පත්වේ.

✾ Why have we got so many temples, if god is everywhere? A wise man said: Air is everywhere, but we still need a fan to feel it.

දෙවියන් හැම තැනම සිටී නම් දේවස්ථාන කුමටද? එයට වැඩිහිටියෙක් මෙසේ පැවසීය. " සුළඟ හැම තැනම තිබෙන බව ඇත්තයි. ඒත් එය අපේ ඇඟට දැනෙන්නට නම් පංකාවක් (fan) අවශ්‍ය නේද? "


♦ *දීපා සඳමාලි හේරත්* USA

# Picture of Buddha on a shoe
# බුද්ධ පින්තූරය දැන් සපත්තුවටත්

This is the latest trade ploy to insult a religion. They say they cater for customer needs.

Buddhism has become an easy prey now. Within last few years we saw many western companies launched their products using Buddha image in various ways. Buddha candles, Buddha bikini wear, Buddha bra and Ikea company designed a toilet seat cover with Buddha's picture.

බුදුන්ට ගැරහීමේ අවසානයක් නැත



මේ ළඟදී වෙළඳපොළට ඒමට නියමිත බුද්ධ රූපය යෙදූ පාවහන් වර්ගයකි.